# මේඩ් ඉන් ශ්‍රී ලංකා ලාංඡනය ප්‍රදානය
# (Awarding Made In Sri Lanka Logo)

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය

561/3, ඇල්විටිගල මාවත

කොළඹ 05.

# අන්තර්ගතය


**1.** අප ගැන ....... 3

**2.** මේඩ් ඉන් ශ්‍රී ලංකා සංකල්පය යනු කුමක්ද? ....... 3

**3.** මේඩ් ඉන් ශ්‍රී ලංකා ලාංඡනය (Made In Sri Lanka Logo) යනු කුමක්ද? ....... 3

**4.** මේඩ් ඉන් ශ්‍රී ලංකා ලාංඡනය ....... 3

**5.** මේඩ් ඉන් ශ්‍රී ලංකා ලාංඡනය ලබා ගැනීම සඳහා සපුරාලිය යුතු කොන්දේසි ....... 4

**6.** ව්‍යවසායකයාට අත්වන ප්‍රතිලාභ ....... 4

**7.** පාරිභෝගිකයාට අත්වන ප්‍රතිලාභ ....... 5

**8.** ජාතිකමය වටිනාකම ....... 5

**9.** මේඩ් ඉන් ශ්‍රී ලංකා ලාංඡනය ලබා ගැනීමට ව්‍යවසායක ඔබ අයදුම් කල යුත්තේ කෙසේද? ....... 5

**10.** මේඩ් ඉන් ශ්‍රී ලංකා ලාංඡනය ලබාගැනීමට ඔබ නුසුදුසු වන්නේ කවර අවස්ථාවක දීද? ....... 6

**11.** මේඩ් ඉන් ශ්‍රී ලංකා ලාංඡනය ලබාගැනීමට ඔබ විසින් ඉදිරිපත් කළ යුතු ලියකියවිලි මොනවාද? ....... 6

**12.** NEDA ප්‍රාදේශීය නිලධාරී කාර්යභාරය ....... 7

**13.** මේඩ් ඉන් ශ්‍රී ලංකා ලාංඡනය ලබා දීම සඳහා සලකා බලනු ලබන ක්ෂේත්‍ර ....... 7

**14.** මේඩ් ඉන් ශ්‍රී ලංකා ලාංඡනය ලබාදීම සඳහා වන අභ්‍යන්තර කමිටුව ....... 7

**15.** මේඩ් ඉන් ශ්‍රී ලංකා ලාංඡනය ලබාදීම සඳහා වන විද්වත් කමිටුව ....... 8

**14.1** කමිටු සංයුතිය ....... 8

**14.2** කමිටු සාමාජිකයින් නැවත පත් කිරීම ....... 8

**14.3** කමිටු රැස්වීම් ....... 8

14.4 කමිටු සාමාජිකයින් සඳහා වන දීමනාව ....... 8

**16.** මේඩ් ඉන් ශ්‍රී ලංකා සන්නාමය සඳහා අයදුම් කිරීමේ ක්‍රියාවලිය ....... 9

**17.** සන්නාම ප්‍රදානය සඳහා වන ගාස්තු අයකිරීම ....... 10

**18.** පසුවිපරම් කිරීම ....... 10

**19.** ලාංඡනයේ වලංගු කාලය නැවත දීර්ඝ කිරීම ....... 10

**20.** ලාංඡනය අවලංගු කිරීම ....... 11

**21.** පැමිණිලි සහ යෝජනා ....... 11

## 1. අප ගැන

ශ්‍රී ලංකාව තුළ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ප්‍රවර්ධනය, සංවර්ධනය හා පහසුකම් සැලසීම යන අරමුණු පෙරදැරි කොට ගෙන කර්මාන්ත අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ව්‍යවසායක ක්ෂේත්‍රයේ අභිවෘධිය සඳහා වන ප්‍රමුඛ පෙළේ රාජ්‍ය ආයතනයක් ලෙස ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය කටයුතු කරනු ලබයි.

## 2. මේඩ් ඉන් ශ්‍රී ලංකා සංකල්පය යනු කුමක්ද?

ව්‍යවසායකයන් විසින් වර්තමානයේ මුහුණ දෙන ප්‍රධානතම ගැටලුව වන අධික නිෂ්පාදන පිරිවැය සහ නිෂ්පාදන සඳහා නිසි වෙළඳ පොළක් නොමැතිවීම යන කරුණු කෙරෙහි අවධානය යොමුකර ව්‍යවසායකයන් සඳහා නිසි දේශීය හා ජාත්‍යන්තර වෙළඳපොල ප්‍රවේශය අරමුණු කර ගනිමින් හඳුන්වා දෙන ලදී. ශ්‍රී ලාංකීය ව්‍යවසායකයන් ප්‍රමිතියෙන් උසස් නිර්මාණ ජාත්‍යන්තර වෙළඳ පොළ වෙත යොමු කොට අපනයන කටයුතු ඉහළ නැංවීමත්, ව්‍යවසායකයින් මූල්‍යමය වශයෙන් ශක්තිමත් කොට විදේශ විනිමය ඉපයීම ඉහළ නැංවීමටත් මෙමගින් අවස්ථාව සැලසේ.

## 3. මේඩ් ඉන් ශ්‍රී ලංකා ලාංඡනය (Made In Sri Lanka Logo) යනු කුමක්ද?

මේඩ් ඉන් ශ්‍රී ලංකා සංකල්පයට සමගාමීව මෙම ලාංඡනය වර්ෂ 2020 දී ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය මගින් දියත් කල අතර, අනුමත නිෂ්පාදන සඳහා වසර දෙකක කාලසීමාවක් සඳහා මෙම ලාංඡනය භාවිතා කිරීමේ අයිතිය ප්‍රදානය කෙරේ. ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර, කුඩා, මධ්‍ය හා විශාල පරිමාණ ව්‍යවසාය අංශයේ ප්‍රයත්නයන්, අපනයන සහ ජාතික ආර්ථිකයේ දියුණුව සඳහා ඔවුන් දක්වන දායකත්වය ඇගයීම මෙහි ප්‍රමුඛ අරමුණක් වේ. මෙය ජාතික බුද්ධිමය දේපල කාර්යාංශයේ ලියාපදිංචිය සහිත ලාංඡනයකි.

## 4. මේඩ් ඉන් ශ්‍රී ලංකා ලාංඡනය

කහ සහ දුඹුරු යන වර්ණ සංකලනයෙන් පෙති හතරක මලක් දුඹුරු පැහැ හතරැස් හැඩති කොටුවක් තුල යෙදීමෙන් මෙම ලාංඡනය නිර්මාණය කර ඇති අතර, එය ශ්‍රී ලාංකීය නාමය අපගේ නිෂ්පාදන හරහා දේශීය මෙන්ම විදේශීය වෙළඳපල තුලද ප්‍රචලිත කරවීම සඳහා මනා කලඑළියක් ලබා දෙයි. මෙම ලාංඡනය සඳහන් නිෂ්පාදන සැබෑ ශ්‍රී ලාංකීය අගය එකතු කල නිෂ්පාදන බවත් එමගින් පාරිභෝගිකයාට සහතිකයක් ලබා දේ.

## 5. මේඩ් ඉන් ශ්‍රී ලංකා ලාංඡනය ලබා ගැනීම සඳහා සපුරාලිය යුතු කොන්දේසි

- ඔබ ව්‍යවසායකයෙකු /ව්‍යවසායිකාවක් වීම හෝ කර්මාන්තකරුවෙකු විය යුතුයි.
- ඔබගේ ව්‍යාපාරය ලියාපදිංචි කර තිබීම අනිවාර්යය වන අතර. තම නිෂ්පාදනය හෝ සේවාව සඳහා වන මූලික නෛතික අවශ්‍යයතා සම්පූර්ණ කර තිබිය යුතුය.
- අඛණ්ඩව අවම වශයෙන් වසර 2ක් වත් ක්‍රියාකාරීව තම ව්‍යාපාරය පවත්වාගෙන ගොස් තිබිය යුතුයි.
- අවම දේශීය අගය එකතු කිරීම 60% ක් වත් සහිත භාණ්ඩයක් විය යුතු අතර, ආනයනික අමුද්‍රව්‍ය මත පදනම් වූ නිෂ්පාදනයක් නම් එහි එකතු කල අගය 30% හෝ ඊට වඩා වැඩි විය යුතුය. දේශීය බව තහවුරු කල හැකි විය යුතුයි. තවද දැනුම ප්‍රාග්ධනය වන අවස්ථාවකදි කමිටුවේ විශේෂ අවධානයට ලක් කරනු ඇත.
- මෙම සන්නාමය ලබා දෙනුයේ යම් කිසි ආයතනයකට නොව නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩයකට පමණි.
- සන්නාම ලාංඡනය භාවිතා කිරීම සඳහා අවසර ලබා දෙන නිෂ්පාදනය හැර වෙනත් නිෂ්පාදනයකට සන්නාම ලාංඡනය යොදා ගැනීම එය අවලංගු කිරීමට හේතුවේ.
- සත්‍ය නිෂ්පාදකයාගේ නම සඳහන් නොවන අවස්ථාවක මෙම ලාංඡනය භාවිතා කල නොහැක.
- සන්නාම ලාංඡනය කිසිම අයුරකින් තවත් කෙනෙකුට/ආයතනයකට පැවරීමක් කල නොහැක.
- නිරවද්‍යතාව තහවුරු කරගැනීම සඳහා සම්පූර්ණ නිෂ්පාදන ක්‍රියාවලිය විශ්ලේෂණය කරනු ඇත.
- සන්නාම ලාංඡනය ලබා දෙනු ලබන්නේ නිෂ්පාදනයකට බැවින් හැම විටම එහි ගුණාත්මක බව ආරක්ෂා කිරීමට ව්‍යවසායකයා බැඳී සිටී. එමෙන්ම දේශීය අනන්‍යතාවය තහවුරු කිරීමක් බැවින් සෑම විටම MADE IN SRI LANKA සංකල්පයට හානියක් නොවන බවට වග බලා ගත යුතුයි.
- තෝරා ගැනීම් ස්වාධීන කමිටුවක් මගින් සිදු කරනු අතර, විද්වත් කමිටුවේ තීරණය අවසන් තීරණය වේ.
- තෝරා ගැනීම සඳහා කුමන ආකාරයකින් හෝ බලපෑම් කිරීම අයදුම්පත ප්‍රතික්ෂේප කිරීමට හේතුවක් වේ.
- සපයා ඇති තොරතුරු අසත්‍ය බවට අනාවරණ වුවහොත් සන්නාම ලාංඡනය අවලංගු කිරීමට සිදුවනු ඇත.
- කිසිදු අයුරකින් සන්නාම ලාංඡනයේ වර්ණ මාරු කිරීම සිදුකල නොහැක.
- සන්නාම ලාංඡනයේ හැඩය /ස්වභාවය අනුපාතිකව විශාලනය කිරීම හෝ ප්‍රමාණනය කිරිම හැර කිසිදු වෙනසක් නොකර භාවිතා කල යුතුය.

## 6. ව්‍යවසායකයාට අත්වන ප්‍රතිලාභ

<u>**මූලික ප්‍රතිලාභ**</u>

- සහනදායී මිල ගණන් යටතේ ප්‍රදර්ශන සහ අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් සඳහා සහභාගී වීම. සම්මානලාභීන්ට අමතර ප්‍රතිලාභයක් ලෙස සහයෝගීතා සංවිධාන විසින් සංවිධානය කරනු ලබන "Made in Sri Lanka Trade Fair" වැනි ජාතික මට්ටමේ ප්‍රදර්ශන සහ වෙනත් සමාන ප්‍රදර්ශන සඳහා සහභාගී වීමේදී ප්‍රමුඛත්වය දෙනු ලැබේ.
- රජයේ ආයතන හරහා සේවා සහ සහතික ලබා ගැනීමේ දී ප්‍රමුඛත්වය ලැබීම.

කර්මාන්ත අමාත්‍යාංශය වැනි රාජ්‍ය ආයතනවලින් සහ වෙනත් ආයතනවලින් සහතික සහ අනුමැතිය ලබා ගැනීමේදී ‘‘ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත’’ ලාංඡන හිමියන්ට ප්‍රමුඛතාවය පිරිනමනු ලැබේ.

- ජාතික සහ ජාත්‍යන්තර වෙළෙඳපොළ තුළ විශ්වසනීයත්වය සහ පිළිගැනීම.
  "මේඩ් ඉන් ශ්‍රී ලංකා" රාජ්‍ය අවසරය යටතේ ප්‍රදානය කරන ලද ප්‍රමුඛතම ජාතික සන්නාමයක් වන අතර, එය ජාතික හා ජාත්‍යන්තර වෙළඳපල අතර පුළුල් පිළිගැනීමක් සහ ප්‍රවේශයක් ඇති කරයි.
- පුහුණු සහ දැනුවත් කිරීමේ අවස්ථා
  විවිධ ආයතන මගින් දේශීය හා ජාත්‍යන්තර වශයෙන් සංවිධානය කරන ලද පුහුණු පහසුකම් ලබා ගැනීමට ප්‍රමුඛත්වය දිය හැකිය.

<u>වෙනත් ප්‍රතිලාභ</u>

- තම නිෂ්පාදනයට දේශීය අනන්‍යතාවක් ඇති බවට රාජ්‍ය ආයතනික ව්‍යුහය හරහා සහතිකයක් ලැබීම.
- දේශීය හා ජාත්‍යයන්තර අංශවලට ව්‍යාපාරය ව්‍යාප්ත කර ගැනීමට ඊ වාණිජ වෙළඳ ද්වාර සේවා සඳහා සම්බන්ධ කිරීම.
- අවශ්‍යය විටක තාක්ෂණික සහය ලබා දීම හා නොමිලේ විදේශීය තාක්ෂණික සහයන් ලබා දීම.
- මේඩ් ඉන් ශ්‍රී ලංකා වෙළඳ කුටි සඳහා බලය පැවරීම.

## 7. පාරිභෝගිකයාට අත්වන ප්‍රතිලාභ

- දේශීය නිෂ්පාදනවල ගුණාත්මකභාවය සහතික කිරීම හරහා සැබෑ නිෂ්පාදකයාට වටිනාකමක් ලැබීම හා සමාජය තුළ නිරන්තර දැනුවත්භාවය ගොඩ නැගීම.

## 8. ජාතිකමය වටිනාකම

- ‘Made IN SRI LANKA LOGO’ ජාතික සන්නාමයක් ලෙස
  ‘‘මේඩ් ඉන් ශ්‍රී ලංකා ලාංඡනය’’ යනු තරඟකරුවන් අතර නිෂ්පාදන ඉස්මතු කරන අද්විතීය ජාතික සන්නාමයක් වන අතර, එමඟින් දේශීයව නිෂ්පාදිත නිෂ්පාදනවල විශ්වසනීයත්වය ඉහළ නංවන අතර, එමඟින් ව්‍යාපාරවල විශිෂ්ටත්වයට මග පාදයි.
- කර්මාන්තයක් ලෙස ව්‍යාපාරය දියුණු කිරීම සහ ශක්තිමත් කිරීම.
- නිෂ්පාදනවල ගුණාත්මකභාවය සහතික කිරීමට දිරිමත් කිරීම.
  ප්‍රමිතිගත සහ ස්ථාවර නිෂ්පාදන සංස්කෘතියක් සහතික කරමින් වෙළෙඳපොළ තුළ බාල නිෂ්පාදන අධෛර්යමත් කිරීමට මෙය වටිනා අවස්ථාවක් වනු ඇත.

## 9. මේඩ් ඉන් ශ්‍රී ලංකා ලාංඡනය ලබා ගැනීමට ව්‍යවසායක ඔබ අයදුම් කල යුත්තේ කෙසේද?

- ඔබ මේ සඳහා මූලික සුදුසුකම් සපුරා ඇත්නම් ඔබට ආසන්නතම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ NEDA ව්‍යවසාය සංවර්ධන නිලධාරී හමුවන්න (ඔබේ ව්‍යාපාරය ස්ථානගතව ඇති).
- මූලික සුදුසුකම් සපුරන්නේ නම් අපගේ ප්‍රාදේශීය නිලධාරී හරහා ඔබට අයදුම්පත්‍රයක් ලබා ගත හැකිය.
- නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය හා අදාළ ලේඛන පිටපත් අදාළ NEDA ව්‍යවසාය සංවර්ධන නිලධාරී වෙත ලබා දෙන්න.

- අයදුම්පත්‍රයේ තොරතුරු නිසි පරිදි සපයා ඇත්නම් අදාළ ක්ෂේත්‍ර පරීක්ෂාවකින් අනතුරුව NEDA නිලධාරී හා ප්‍රාදේශීය ලේකම් විසින් සහතික කරන ලද අයදුම්පත්‍රය ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය වෙත යොමු කෙරේ.
- අධිකාරියේ ඇගයුම් ක්‍රමවේදයකින් අනතුරුව ලාංඡනය ලබාදීම සඳහා සුදුසුකම් සපුරා ඇත්නම් එය ඔබ වෙත ප්‍රදානය කෙරෙනු ඇත.
- ලාංඡනය ලබා දීම සඳහා අනුමත වු පසු ගිවිසුමක් සමග ලාංඡනය ලබා දෙන අතර ලියාපදිංචි අංකයක්ද ලබා දෙනු ඇත.
- ලාංඡනය ලැබුණු දින සිට වසර දෙකක කාලයක් සඳහා ඔවුන්ගේ අයදුම් කරන ලද නිෂ්පාදන, ලිපි ශීර්ෂ හා ප්‍රවර්ධන කටයුතු සඳහා ලාංඡනය භාවිතා කිරීමේ වරප්‍රසාදය ඇත.
- සන්නාම ලාංඡනය හා ලියාපදිංචි අංකය ලබා ගත් පසු හෝ තම ආයතනයේ නිෂ්පාදනයක් සඳහා නැවත සන්නාම ලාංඡනය ලබා ගැනීම අවශ්‍ය නම් ඒ සඳහා නැවත ඉල්ලුම් කොට භාණ්ඩ ලැයිස්තුව යාවත්කාලීන කර ගත හැක.
- යම් කිසි කරුණක් හේතුවෙන් ඔබගේ අයදුම්පතේ යම් නිවැරදි කල හැකි අඩුපාඩුවක් ඇත්නම් එය අපගේ ප්‍රාදේශීය නිලධාරී හරහා නිවැරදි කිරීමෙන් අනතුරුව අයදුම්පත ඉදිරි කටයුතු සඳහා යොමු කෙරෙනු ඇත.
- අධිකාරියට යොමු කිරීමෙන් අනතුරුව ඔබගේ අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප වූයේ නම් ඒ බව සඳහන් ලිපියක් ඔබ වෙත ලැබෙනු ඇත.

## 10. මේඩ් ඉන් ශ්‍රී ලංකා ලාංඡනය ලබාගැනීමට ඔබ නුසුදුසු වන්නේ කවර අවස්ථාවක දීද?

- විනිමය පාලන නීති, රේගු අණපනත් , ආනයන/අපනයන පාලන නීති හෝ වෙනත් වංචනික ක්‍රියාවක් සම්බන්ධයෙන් චෝදනා එල්ල වී ඇති හෝ වරදකරු වී ඇති ව්‍යවසායකයෙක් නම්
- බැංකු ණය පැහැර හැර ඇති අයදුම්කරුවෙක් නම්
- දේශීය එකතු කිරීමේ අගය 60% කට වඩා අඩු භාණ්ඩයක් හෝ සේවාවක් නම් හෝ ආනයනිත එකතු කල අගය 30% ඉක්මවන්නේ නම්
- ව්‍යාපාර ලියාපදිංචිය නොමැතිනම්
- ව්‍යාපාරයෙ ක්‍රියාකාරී පැවැත්ම අවුරුදු දෙකකට වඩා අඩු නම්
- නිෂ්පාදන ක්‍රියාවලිය නිරීක්ෂණය සඳහා පහසුකම් නොසලසන්නේ නම්
- නිෂ්පාදන ක්‍රියාවලිය ආශ්‍රිතව නිවැරදි දත්ත ලබා දී නොමැති අවස්ථාවක දී

***ඔබගේ නිෂ්පාදනය හෝ සේවාව මෙම ලාංඡනය ලබා ගැනීම සඳහා සුදුසුකම් නොලබයි.***

## 11. මේඩ් ඉන් ශ්‍රී ලංකා ලාංඡනය ලබාගැනීමට ඔබ විසින් ඉදිරිපත් කළ යුතු ලියකියවිලි මොනවාද?

a) නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත
ලාංඡනය ලබා ගැනීම සඳහා අයදුම් කරන සියලු නිෂ්පාදන / සේවාවල සියලු විස්තර මෙහි සඳහන් කල යුතු වේ. අයදුම්පත්‍රය පිරවීමට පෙර සියලු උපදෙස් කියවීම අවශ්‍ය වේ.

b) ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපතක් (සත්‍ය පිටපත තහවුරු කිරීම සඳහා ඉදිරිපත් කළ යුතු වේ)

c) නිෂ්පාදන හෝ සේවා වලට අදාළ තත්ත්ව සහතිකවල පිටපත් (ඇත්නම්)

d) නිෂ්පාදන හෝ සේවා සඳහා ලැබූ ඇගයීම් සහතිකවල පිටපත් (ඇත්නම්)

e) නිෂ්පාදනයේ ඇසුරුම හා ලේබලය පැහැදිලි වන සේ ලබා ගන්නා ලද පැහැදිලි ඡායාරූප කිහිපයක්

## 12. NEDA ප්‍රාදේශීය නිලධාරී කාර්යභාරය

I. ඔබ වෙත ලැබෙන සියලු අයදුම්පත්‍ර මනා පරීක්ෂාවකට ලක් කල යුතුය .
II. අවශ්‍ය විටකදී අයදුම්කරු වෙත අවශ්‍ය පැහැදිලි කිරීම් කල යුතුය .
III. ක්ෂේත්‍ර පරීක්ෂාව අනිවාර්යෙන්ම සිදු කල යුතු වේ.
IV. ක්ෂේත්‍ර පරීක්ෂාවේ දී ඔබ විසින් නිරීක්ෂණය කෙරෙන යම් තොරතුරක් ඇත්නම් එය අයදුම්පත්‍රයේ සඳහන් කල යුතුය.
V. ව්‍යාපාර ලියාපදිංචිය හා අනෙකුත් සහතික පිටපත් නිවැරදි දැයි බලා සත්‍ය පිටපත් බවට තහවුරු කොට තිබිය යුතුය.
VI. නියමිත සුදුසුකම් සපුරා නොමැති කිසිදු විටෙකදී අයදුම්පත් බාර ගැනීම සිදු නොකළ යුතුය.

## 13. මේඩ් ඉන් ශ්‍රී ලංකා ලාංඡනය ලබා දීම සඳහා සලකා බලනු ලබන ක්ෂේත්‍ර

දේශීය හෝ ආනයනික අමුද්‍රව්‍ය යොදා ගනිමින් සිදු කරනු ලබන නිෂ්පාදන මේ සඳහා සලකා බැලේ. සේවා සඳහා ලාංඡනය ලබා දීමක් සිදු නොකෙරේ.

## 14. මේඩ් ඉන් ශ්‍රී ලංකා ලාංඡනය ලබාදීම සඳහා වන අභ්‍යන්තර කමිටුව

ප්‍රධාන කාර්යාලය වෙත ලබා දෙන අයදුම්පත්‍ර පහත සාමාජිකයන් ගෙන් සැදුම්ලත් කමිටුවක් විසින් වැඩිදුරටත් පරික්ෂා කිරීම සිදුකෙරේ.

i. සහකාර අධ්‍යක්ෂ - සංවර්ධන
ii. ව්‍යවසාය ප්‍රවර්ධන නිලධාරී
iii. ව්‍යවසාය ප්‍රවර්ධන සහකාර

මෙම කමිටුවේ කාර්යභාරය පහත පරිදි වේ.

- කමිටුවට ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් නිවැරදි හා අඩුපාඩු රහිතව ඉදිරිපත් කිරීම සභාපතිතුමා / අධ්‍යක්ෂතුමා විසින් පත්කරනු ලැබූ ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ විෂය භාර නිලධාරි කමිටුව විසින් සිදුකල යුතුය.

- විෂය භාර නිලධාරී විසින් කමිටුව අවසානයේ ඉදිරිපත් කල අයදුම්පත් හා එහි නිර්දේශයන් පිළිබඳ සාරාංශයක් සකස් කිරීම අනිවාර්යය වේ.

- නැවත ඉදිරිපත් කිරීමේ හැකියාව ඇති අයදුම්පත් නිවැරදි කර ගැනීම සඳහා අවශ්‍යය සහයෝගය /අවශ්‍යය ආයතන සම්බන්ධීකරණය කමිටුව විසින් සිදුකල යුතුයි.

- සුදුසුකම් පරික්ෂා කිරීම සඳහා ලකුණු දීමේ ක්‍රමවේදයක් අනුගමනය කල යුතු අතර අවසාන ලකුණු, ප්‍රතිශතයක් ලෙස අවම දේශීය අගය එකතු කිරීම සපුරාලිය යුතුය.

## 15. මේඩ් ඉන් ශ්‍රී ලංකා ලාංඡනය ලබාදීම සඳහා වන විද්වත් කමිටුව

ප්‍රාදේශීය නිලධාරී හරහා ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය ට යොමු කෙරෙන අයදුම්පත් අධිකාරියේ අභ්‍යන්තර කමිටුව විසින් යලි පරීක්ෂා කොට සහතික කිරීමෙන් අනතුරුව අධිකාරිය විසින් පිහිටුවනු ලැබූ විද්වත් කමිටුවකට යොමු කෙරේ. එහිදී අයදුම්පත්‍රය හා අදාල අනෙකුත් ලිපි ලේඛන ඇසුරෙන් නිසි ඇගයීමකට ලක්කොට කමිටු සාමාජිකයන්ගේ (5/7 ක අවම) අනුමැතියෙන් ලාංඡනය ලබාදීම සඳහා නිර්දේශ කෙරේ. කමිටු නිර්දේශය නොලබන අවස්ථාවකදී ඒ බව සඳහන් කොට අදාළ අයදුම්කරුට ලිඛිතව දැනුම් දෙනු ලැබේ (අදාල ප්‍රාදේශීය නිලධාරීන් හට ලිපියේ පිටපතක් ද සහිතව).

### 14.1 කමිටු සංයුතිය

අධිකාරියේ ආරාධනය මත විවිධ ක්ෂේත්‍ර නියෝජනය කරන විද්වතුන් 08 දෙනෙකුගෙන් මෙම ලාංඡන ඇගයීම් කමිටුව සමන්විත වේ. ඒ අනුව පහත ආයතන නියෝජනය වනසේ සාමාජිකයන් පත් කිරීම කර්මාන්ත අමාත්‍යාංශය හරහා සිදු කෙරේ.

I. ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය (NEDA)
II. ජාතික මෝස්තර මධ්‍යස්ථානය (NDC)
III. කර්මාන්ත අමාත්‍යාංශය (MI)
IV. ශ්‍රී ලංකා ජාතික බුද්ධිමය දේපල කාර්යාලය (NIPO)
V. ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය (EDB)
VI. ලංකා වාණිජ මණ්ඩලය (NCCSL)
VII. ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනය (SLIM)
VIII. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (SLS)

### 14.2 කමිටු සාමාජිකයින් නැවත පත් කිරීම

තනතුරු මාරු වීම මත කමිටු සාමාජිකයන්ගේ නව පත් කිරීම් අදාල පරිදි අධිකාරිය මැදිහත් වීමෙන් සිදු කෙරේ. එසේ නොමැති විටක එම තනතුරු දරන කාලය පුරාවටම කමිටුවේ ධූරය දැරීමට සුදුසුකම් ලබයි. යම් පෞද්ගලික හේතුවක් හෝ වෙනයම් කරුණක් මත කමිටු සාමාජිකත්වයෙන් ඉල්ලා අස්වීමට සාමාජික විද්වතුන් හට බල තල ඇත.


### 14.3 කමිටු රැස්වීම්

අධිකාරිය විසින් අවශ්‍යතාවය මත වසරකට කිහිප වරක් කමිටුව රැස් කිරීමට කටයුතු කරනු ලැබේ. ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ අංක 561/3, ඇල්විටිගල මාවත, කොළඹ 05 යන ස්ථානයේ පිහිටි අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ දී හෝ තීරණය කරන ලද සුදුසු ස්ථානයකදී කමිටු රැස්වීම් පැවැත්වීම සිදු කරනු ලැබේ.

### 14.4 කමිටු සාමාජිකයින් සඳහා වන දීමනාව

එක් කමිටු රැස්වීම් වාරයක් සඳහා එක් සාමාජිකයෙකුට රු.2500.00 ක දීමනාවක් ගෙවීමට ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී තීරණය කරන ලදී.

16. මේඩ් ඉන් ශ්‍රී ලංකා සන්නාමය සඳහා අයදුම් කිරීමේ ක්‍රියාවලිය



## 17. සන්නාම ප්‍රදානය සඳහා වන ගාස්තු අයකිරීම

සන්නාම ලාංඡනය ලබා ගැනීම සඳහා වන ගාස්තු පහත පරිදි වේ.

| අයදුම්පත්‍රය | ගාස්තු අය නොකෙරේ |
|---|---|
| පළමු නිෂ්පාදනය සඳහා | 10,000.00 |
| ඉතිරි නිෂ්පාදන සඳහා එක් නිෂ්පාදනයකට | 1,000.00 බැගින් |
| සන්නාම ලාංඡනය නැවත අලුත් කිරීමේ ගාස්තුව | එක් නිෂ්පාදනයක් සඳහා පළමු ගාස්තුවෙන් 50% ක් වන සේ අය කෙරේ. |

## 18. පසුවිපරම් කිරීම

- නියාමනය කිරීමේ සම්පූර්ණ වගකීම අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ව්‍යවසාය සංවර්ධන නිලධාරි මගින් සිදුකෙරෙනු ඇත.
- නිලධාරීන් නොමැති ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් නම් ආසන්නතම ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ නිලධාරි හෝ ප්‍රධාන කාර්යාලයේ අදාල ව්‍යවසාය ප්‍රවර්ධන සහකාර/ ව්‍යවසාය ප්‍රවර්ධන නිලධාරි විසින් සිදුකරනු ලබයි.
- එකග වූ නියමයන් කොන්දෙසි නිසියාකාරව පිළිපදින්නේ දැයි සොයා බැලීම ඔවුන් විසින් විවිධ පැති කඩ ඔස්සේ සිදු කරනු ලබයි.
  (සන්නාම ලාංඡනය භාවිතා කිරීම සඳහා අවසර ලබා දෙන නිෂ්පාදනය හෝ සේවාවට හැර වෙනත් නිෂ්පාදනයකට /සේවාවකට යොදා ගන්නේද, සත්‍ය නිෂ්පාදකයාගේ/සේවා සපයන්නාගේ නම සඳහන් නොවන අවස්ථාවක මෙම ලාංඡනය භාවිතා කරන්නේද, නිරවද්‍යතාව තහවුරු කරගැනීම සඳහා වරින්වර සම්පූර්ණ ක්‍රියාවලියම විශ්ලේෂණය කිරීම, යම් අවස්ථාවක බාහිර පාර්ෂවයක් මගින් පැමිණිල්ලක් ලැබුනු අවස්ථාවක ඒ සඳහා ක්‍රියාත්මක වීම.)
- වසර 2 කට වරක් සන්නාම ලාංඡනය අලුත් කිරීම දැනුවත් කිරීම.
- අවශ්‍යය ඔනෑම අවස්ථාවක පරීක්ෂා කිරිමේ බලය ප්‍රදේශිය ව්‍යවසාය සංවර්ධන නිලධාරි හෝ ප්‍රධාන කාර්යාලයේ මේ සඳහා පත්කර ඇති නිලධාරීට බලය ඇත.
- දේශිය නිෂ්පාදන දිරිමත් කිරීම සඳහා අවශ්‍යය දැනුවත් කිරීම් සඳහා සහය විම ,සම්බන්ධීකරණය,මග පෙන්වීම නිරන්තරයෙන් ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් හා ප්‍රාදේශීය ව්‍යවසාය සංවර්ධන නිලධාරීන් විසින් සිදුවිය යුතුයි.

## 19. ලාංඡනයේ වලංගු කාලය නැවත දීර්ඝ කිරීම

ලාංඡනය ලබාදීමෙන් පසු වසර දෙකක කාලය ඉක්ම යාමෙන් අනතුරුව ලාංඡනය නැවත වලංගු භාවයට පත් කිරීම අත්‍යවශ්‍ය වේ. මේ සඳහා ව්‍යවසායක ඔබ විසින් වලංගු කාලය ඉක්මවා යාමට මසකට පෙර ඒ සඳහා වන අයදුම්පත්‍රය නිසි පරිදි සම්පූර්ණ කොට ප්‍රාදේශීය ව්‍යවසාය සංවර්ධන නිලධාරී හට භාර දිය යුතුය. එහිදී අදාල නිලධාරී විසින් නැවත ක්ෂේත්‍ර පරීක්ෂාවකින් අනතුරුව සහතික කරන ලද අයදුම්පත්‍රය ප්‍රධාන කාර්යාලය වෙත ලැබීමට සලස්වනු ලැබේ.ඔබගේ ව්‍යාපාරය හා ලාංඡනය භාවිතා කරන නිෂ්පාදනවල නවතම තොරතුරු ලබා දීමට මෙහිදී සැලකිලිමත් විය යුතුය.

## 20. ලාංඡනය අවලංගු කිරීම

ව්‍යාපාරය වසා දැමීම, අයදුම්කරන ලද නිෂ්පාදන සඳහා නොව වෙනත් නිෂ්පාදන සඳහා අනවසරයෙන් ලාංඡනය භාවිතා කිරීම හෝ ලාංඡනය විකෘති කොට භාවිතා කිරීම, නියමිත කාලසීමාව තුල ලාංඡනය අලුත් නොකිරීම හෝ අධිකාරිය එකඟ නොවන යම්කිසි හේතුවක් මත මෙම ප්‍රදානය කල ලාංඡනය නැවත අවලංගු කිරීමේ බලය අධිකාරිය සතුව ඇත.

## 21. පැමිණිලි සහ යෝජනා

මේ පිලිබඳ යම් කිසි යෝජනා හෝ කිසියම් පැමිණිල්ලක් වේ නම් එය අප වෙත යොමු කරන්න.


තැපැල් අධ්‍යක්ෂ
ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය
නො.561/3, ඇල්විටිගල මාවත
කොළඹ 05.

විද්‍යුත් ලිපිනය : nedamisllogo@gmail.com

දුරකථන : 0112 370091